lion. "I thank the spectators in Australia who have seen the world's greatest players do battle in Melbourne and Sydney and the tens of millions cricket fans around the world who have tuned in to the action. "I also thank our valued broadcast partners including the Host Broadcaster Channel Nine in Australia, our title sponsor Johnnie Walker, our Official Partners ABN Amro, Emirates, Hero Honda, LG and Mastercard, and our official suppliers Hyundai, Reebok and Ben Sherman.

"Many staff and volunteers have dedicated the last few months of their lives to making this tournament a success and I would like to congratulate them for a job well done and thank them for their dedication and tremendous efforts." Cricket Australia Chairman Bob Merriman thanked the ICC for awarding the hosting of the inaugural Johnnie Walker Super Series to Australia. "Thank you to the ICC for providing Australian cricket with the opportunity to host this tournament," said Mr Merriman. "We appreciate the work and commitment from the venues - the Telstra Dome and the Sydney Cricket and Sports Ground Trust - for the wonderful facilities to stage the event.

"And most importantly, we thank the cricket fans for their attendance and support throughout the Johnnie Walker Super Series."

# Mcgrath best pace bowler in Test history

BY CLIFFORD Landers from Australia

Photo by - Vernon J (Snni)

Glenn Mcgrath could not have asked for a better opposition and venue in becoming the best fast bowler in history today.Mcgrath who is four months shy of reaching 36 years, surpassed West Indian Courtney Walsh's 519-wicket mark (132 games) and has shared the bowling mantle with the current world's highest wicket taker Shane Warne in guiding the Aussies to its dominance in world cricket for over decade. It was ideal in that he outbeat the tally whilst playing against the best players in the world (ICC World XI) on his home ground- the SCG - and before his ardent supporters. He is only the second medium pace bowler with West Indian Courtney Walsh to top the 500-wicket milestone in the history of the game and the third best- trailing behind Warne (626) and Sri Lankan spinner Muttiah Muralitharan (565).



He is expected to play until the 2007 World Cup and is strongly tipped to top the 600 mark before he retire. His career began at 23-years of age in 1993/94 against Zimbabwe in Australia. Mcgrath's overall record is: 113 matches, 4397.3 overs, 1314 maidens,11066 runs, Best figures of 8 for 24 against Pakistan, Best match figures of 10 for 27, 21.28 Average, 2.51 Economy rate, 50.7 Striking rate, 25 five-wicket hauls and claimed match bags of 10 wickets or more on three occasions.

His record against Sri Lanka is: played 8, 304.4 overs, 37 wickets, 803 runs, 5 for 37 best figures and 7 for 61 matchbag, 22.24 average, 49.4 striking rate and two five-wicket hauls. Opener Sanath Jayasuriya is the most dismissed Sri Lankan batsman (five times) while overall Englishman Michael Atherton is the most dismissed batsman (19 times).

සන්නස SANNASA

අන්තර්ජාලයන් කියවන්න
www.sannasa.net




ශ්‍රී ලාංකේය සංගීත ක්ෂේත්‍රයේ තවත් එක් යුගයක රසික සිත් සතන් අමන්දානන්දයට පත් කළ ගායන ශිල්පියෙකුගේ හඬින් මෙල්බන් නුවර රසිකයන් පසුගියදා ඒ සොඳුරු අතීතය ආවර්ජනය කර ගැනීමට වාසනාව ලැබුවා. ජන ගී ඇසුරින් නිර්මාණය කෙරුණ උදාන ගී වලින් හඬ ගැන්වී ගුවන් තල සිසාරා සෑම හිමිදිරියකම අසන්නට ලැබුණා වූ ඒ මියුරු හඬ අදද එලෙසින් ම අපට අසන්නට ලැබීම වාසනාවක්ම නොවන්නේ ද?. පසු කාලයක ප්‍රේම ගීත සඳහා සිය ලයාන්විත හඬ දායාද කරමින් ජනප්‍රියත්වයේ හිණි පෙත්තටම පැමිණි මේ සංගීත වේදියා ශිල්පී ටී එම් ජයරත්න යි.

ඉතාම සංවේදී වූ අත්දැකීමක් නිමිති කරගෙන පද පෙළ ගැන්වුණ ගීයක රසයයි අප මෙවර අත් විඳින්නේ. තම නිවහන තුළින් ම ගේය කාව්‍ය නිමවන දයාබර බිරිඳක් ලබන්නට ජයරත්න ශිල්පියාණන් වරම් ලැබීම රසිකයන් ලද වරමක් නොවේ ද? ඇය මාලනී ජයරත්න නම් වන්නීය. මාලනිය අතින් පීතෘ දාරක සෙනෙහස ගැන ලියැවුණ මෙම ගීයේ පද සංවේදී කළ අත්දැකීම් අපගේද නෙත් කෙවෙනි රිදවන්නට තරම් දුක් බර වූ කතාවකි.



"අපේ පවුලේ හොඳ හිතවතෙක් හිටියා..". ටී එම් සිය හඬ අවදි කරයි.

"...ඉතින් මේ යාලුවාට දරුවන් හතර දෙනෙක් හිටියා.. එක්කෙනෙක් අත දරුවෙක්.. බලන්නකෝ ඉතින් අවාසනාවක මහත.. නෝන මහත්තයා මේ අයව දාලා වෙන කෙනෙක් එක්ක ගියානේ.. අපේ මාලනී ඉතින් කොහොමත් දරුවන්ටෙ අපට ලැදියි... ඒ හින්දා මේ අතරමං වුණ අයව බලන්න අපි නිතර නිතර ඒ ගෙදර ආවා ගියා.."

දරුවන්ට, සැමියාට පාන ලෙන්ගතු කම පෙරදිග බිරිඳකට ආගන්තුක ගුණයක් නෙවෙයි. මාලනිය රචිකාවියක ලෙසින් පෑ සෙනෙහස පිළිබඳව විමසන්නට මෙහිදී අප උත්සුක වූයේ එය සිද්ධියේ අවසානයත් එයින් නිර්මාණය වූ අන්දමත් දැන ගන්නට වඩා වැඩි උනන්දුවක් ඇති වුණ නිසා ය.

"අපි මෙහෙම කියමුකෝ... ඒ දවස් වල මම නිතරම ප්‍රසංග වලට දුර බැහැර යනවා... ඒ යන්න පිටත් වෙන්නේ හවස.. එන්නේ පාන්දර.. මාලනීගේ තිබුණා පුදුම සිරිතක්.. සැමදාම දරුවන් රෑට නින්දට යන්න කලින් එයාලට කතා කරලා අප්පච්චි ඒ දවසේ ප්‍රසංගයට ගිය ඉසව්ව පෙන්නලා දීලා ඒ දිශාවට එයාලා ලවා ගාථාව කියලා මට වන්දවනවා.. ඉතින් හිතාගන්නකෝ අපේ ඒ බැඳීම මොන වගේ එකක්ද කියලා.."

"..දවසක් රාත්තිරියේ අප කෑම ටිකක් එහෙම පිළියෙල කරගෙන යනකොට අපට අහන්න දකින්න ලැබුණ දෙයින් අපේ හිත් කීරි

## ගීයක පිටුපස සැඟවුණ කතාව

ගැහුණා.. අපේ හිතවතා පිරිත් කිය කිය අර කුඩා දරුවා ව නලවනවා.. අනිත් දරුවෝ තුන්දෙනා තාත්තා වටේට පැදුරක වැටිලා නිදි. "

"ඉතින් කොහොමද මේ අය ඉතිරි වැඩ පළ කර ගත්තේ..?"

"...අපේ යාලුවා රාජකාරිය කරන තැන අහල පහලින්ම කුඩා කාමරයක් කුලියට අරගෙනයි උන්නේ... මේ නිසාම ලොකුම දරුවාට අනිත් අයව බාර දීලා තමයි වැඩට ගියේ .. දවල් කෑම වෙලාවට එහෙමත් ඇවිත් බලලා කරලා යනවා.. වැඩ කරන තැන අයගේ උදව් එහෙම තිබුණා.." ටීඑම් තමන්ගේ මියුරු හඬින් ගායනා කළ දීර්ඝතම සෝ ගීය මේ යයි මොහොතකට සිතුණේ ගායනාවේදී මෙන්ම මෙම අත්දැකීම් විස්තර කිරීමේදී දැක් වූ හැඟීම් බර බව නිසයි.

මේ දරුවෝ ඉහළම තල වලට නොගියත් හොඳින් ඉගෙන ගෙන අද හොඳ තැන් වල ඉන්නවා.. ඒක නේද අපි කාගේත් සතුට..? අවසාන ටීඑම් අප හමුවේ ප්‍රශ්ණාර්ථයක් සටහන් කළා.

## පිය සෙනෙහසට කව් ගී ලියැවුණා මදී

අම්මා සඳකි - මම ඒ ලොව හිරුය රිදී
ඒ ඉර හඳෙන් නුඹෙ ලෝකය එළිය වුණී
රැකුමට පුතුන් දිවියේ දුක් ලගැහැට විඳී
පිය සෙනෙහසට කව් ගී ලියැවුණා මදී

සිරුරේ දුවන්නෙත් මගෙ ලේ නොවැ පුතුනී
කුසයේ නොදැරුවත් දිවි බර මට රැඳුණේ
මහ මෙරකට උසයි දරු පෙම හද පතුලේ
පුදුමයි පුතුනි කිම මගේ ලේ කිරි නොවුණේ

මවකට මුවා වී නුඹ වෙත දිරි දුන්නේ
මම වෙමි පුතුනි එය මා පමණකි දන්නේ
පිය සෙනෙහස නැතිද දරුවන් හඳුනන්නේ
අම්මා වරුන් පමණද මතු බුදු වන්නේ

පද රචනය මාලනී ජයරත්න
සංගීතය රෝහණ වීරසිංහ
ගායනය ටී එම් ජයරත්න

අම්මා සඳක් සේ වන්නීය. මම ඒ ලොව රිදී පැහැ වන් හිරු වන්නෙමි. ඒ ඉරෙන් සඳෙන් ආලෝකමත් වන ලොව නුඹ වන්නේහිය. දූ පුතුන් රැකීමට බෝ දුක් ගැහැට විඳි පියවරු පිළිබඳව කව් ගී ලියැවුණා නම් මදි මය. පිය සෙහෙස පිළිබඳ ව රසිකයා අවදි කිරීමට පුරෝගාමී වූ ගී රචනාවක ස්ථායි කොටසයි ඒ.

නුඹගේ සිරුර පුරා දිවෙන්නේ මගේ ලෙයමය පුතුනි. කුස්සියේ දී බර නොදැරුවද දිවි රැක ගන්නා වගකීමේ බර දරන්නෙමි මම. මහමෙරක් සේ උස් වූ දාරක සෙනෙහස හද පත්ලෙන්ම නැගෙන්නකි. එවන් මා ලෙය කිරට නොහැරීම පුදුමයකි මාහට නම්. ඉතා ප්‍රබල යෙදුමක් ඉතා සුනම්‍ය ආකාරයකින් ලියැවුණ අයුරු සිතා බලන්න.

මව ළඟ දැවටෙන දරුවෙකුට මවගෙන් ලැබෙන දිරිය මව පියෙකුගෙන් ලබන්නා වූ දිරියේ පරාවර්තනයයි. හිරුගෙන් කිරණ ලැබ රැය අඳුර දුරු කරවන සඳ වක සේ ය. ඒ ස්ථායී කොටසේ උපමා රූපක සම්බන්ධීකරණයක යෙදෙන් නී ය මාලනී රචිකාවිය. එය දන්නේ ලොව නොවේ , පියා පමණක් මය. පුරුෂ ලක්ෂණයකට හිමි සැඩ පරුෂ කම සහ දැඩි බව හමුවේ සැඟවී යන සෙනෙහස හඳුනාගන්නට දරුවන්ට එකවරම පහසු නොවේ. මවගේ සුකුමල වදන් හමුවේ නුඹලා පියකුගේ සෙනෙහස හඳුනා ගන්නේ කවදා ද? අම්මා බුදු වේ වා.. කොතැනත් කෙරෙන සුලබ ප්‍රාර්ථනය හමුවේ පියෙකුගේ චින්තනය හමුවේ ඇතිවන ආත්මානුකම්පාව බෞද්ධ වටා පිටාවකින් රසිකයාට දන්වන්නේ ඉතා ම ශෝකී ස්වරයකින් සහ ගායනාවකිනි.

රෝහණ වීරසිංහ සංගීතවේදියාණන්ගේ මෙන්ම ටී එම් ජයරත්න මියුරු හඬ සෞම්‍ය වූ සංගීත රටා අතරේ මනා සේ නළවා මුදා හැරීමට ස්වර පෙළ පෙළ ගැසෙන්නේ රසිකයා මෝහනයට පත් කරමින්. සංගීත ස්වරයේ පෙළහරින් හෙළ ගී කෙත විශ්මයට පත් කරන්නා වූ රෝහණ වීරසිංහ සංගීත වේදියාණන් ද මෙවන් පද පෙළ ගන්වන මාලනියද ටී එම් ජයරත්න ශිල්පියානන්ද ජාතියට අනර්ඝ සම්පත් නොවන්නේ ද? ■

## VB SERIES

Australia, South Africa, Sri Lanka
January 13 Australia v Sri Lanka Telstra Dome, Melbourne
January 15 Australia v South Africa Gabba, Brisbane
January 17 South Africa v Sri Lanka Gabba, Brisbane
January 20 Australia v South Africa Telstra Dome, Melbourne
January 22 Australia v Sri Lanka SCG, Sydney
January 24 South Africa v Sri Lanka Adelaide Oval, Adelaide
January 26 Australia v Sri Lanka Adelaide Oval, Adelaide
January 29 Australia v Sri Lanka WACA, Perth
January 31 South Africa v Sri Lanka WACA, Perth
February 3 Australia v South Africa Telstra Dome, Melbourne
February 5 Austraila v South Africa SCG, Sydney
February 7 South Africa v Sri Lanka Bellerive, Hobart
February 10 First Final Adelaide Oval, Adelaide
February 12 Second Final SCG, Sydney
February 14 Third Final (if required) Gabba, Brisbane